museum of modern
and contemporary art
sri lanka

## Quarterly Newsletter #12 – October 2025

2025 ජූනි මාසයේදී අපගේ තාවකාලික පරිශ්‍රයෙන් ඉවත් වූ පසු, ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) පුහුණුව, පර්යේෂණ, සහයෝගීතාව, සහ කලාපීය හා ජාත්‍යන්තර සම්බන්ධතා පුළුල් කිරීම කේන්ද්‍ර කරගත් නව සංවර්ධන අදියරක සක්‍රීයව නියැලී සිටියි.

### කලාපීය සබඳතා ගොඩ නැගීම

අපගේ ප්‍රධාන අභිරක්ෂක **ශාර්මිණී පෙරේයිරා** Experimenter Learning Program Foundation විසින් සංවිධානය කළ ඉන්දියාවේ කොල්කටාහි (ජූලි 18–19) පැවති 14 වන Experimenter Curators' Hub දී ඉදිරිපත් කිරීමක් කළා ය. ඇය සමඟ **තිනාල් සජීව** (සහාය අභිරක්ෂක), **නිමායා හැරිස්** (ව්‍යාපෘති අභිරක්ෂක), සහ **කෞමදී ජයවීර** (සංස්කාරක සහායක) එක්ව සිටියහ. ජූලි 20 දින නවදිල්ලියේ Pro Helvetia විසින් සංවිධානය කරන ලද 'An Act of Repair: Hosting, Healing and the Future' නම් සමූහ සාකච්ඡාවට ද පෙරේයිරා සහභාගී විය.

ජූලි මස අවසානයේ දී, **නිමායා හැරිස්** 'Framing Modernity: Minnette de Silva Archive and Postcolonial Image-making' නම් පර්යේෂණ නිබන්ධය, ඕෆ්සෙට් ප්‍රොජෙක්ස්ට්, අල්කාසි පදනම, සහ නවදිල්ලියේ මේස් සාමූහික චිත්‍රාගාරය විසින් සංවිධානය කළ Image Worlds: Approaching the Bicentennial of Photography හි දී (ජූලි 25–26) ඉදිරිපත් කළා ය. මේ හරහා MMCA ශ්‍රී ලංකා කෞතුකාගාරය ලෝක ස්මාරක අරමුදල සමග එක්ව නියැලෙන ඩිජිටල් ලේඛනාගාර ව්‍යාපෘතියක් ගැන දැනුවත් කිරීමක් කෙරුණි.

මෙම කර්තව්‍ය, MMCA ශ්‍රී ලංකා විසින් ආසියාවේ සහ ඉන් ඔබ්බට පැතිරී ඇති පුළුල් කලා හා සංස්කෘතික ප්‍රජාව සමග සබඳතා ශක්තිමත් කිරීම සඳහා කරමින් යන, අඛණ්ඩ ප්‍රයත්න පිළිබිඹු කරයි.

Goethe-Institut සහ Max Mueller Bhavan හි සහයෝගය සමඟ, Khoj ජාත්‍යන්තර කලාකරුවන්ගේ සංගමය විසින් සත්කාරකත්වය සැපයූ, Curatorial Intensive South Asia හි (28 July–11 August) හත්වන සංස්කරණයට **තිනාල් සජීව** සහභාගී වීම හරහා ද මෙවැනි සබඳතා තවදුරටත් වර්ධනය විය. මේ අතර, **සන්දේව් හැන්ඩි** (ජ්‍යෙෂ්ඨ අභිරක්ෂක), දකුණු කොරියාවේ ග්වාන්ජු බියනාලේ ඇකඩමියේ ජාත්‍යන්තර අභිරක්ෂණ පාඨමාලාවට එක්වෙමින්, සැප්තැම්බර් 15 දින එහි දේශනයක් සහ වැඩමුළුවක් ද පැවැත්වීය.

### කෞතුකාගාර තීව්‍ර 4: නවීන ගොඩනැගිලි ලේඛනගත කිරීම

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

මේ අතරවාරයේ කොළඹ දී, අපගේ වෘත්තීය පුහුණු වැඩසටහන වන 'කෞතුකාගාර තීව්‍ර' හි නවතම සංස්කරණය අපි සංවිධානය කළ අතර, එයට සංවිධාන හයක් සහ සහභාගිවන්නන් 19 දෙනෙකු සහභාගී විය.

'කෞතුකාගාර තීව්‍ර 4: නවීන ගොඩනැගිලි ලේඛනගත කිරීම' 2025 සැප්තැම්බර් 29 සිට ඔක්තෝම්බර් 2 දක්වා පැවැත්වුණු අතර, නවීන ගෘහ නිර්මාණ ශිල්පයේ උරුමය ලේඛනගත කිරීම සහ සංරක්ෂණය කිරීමේ ක්‍රමවේද කෙරෙහි මෙහිදී අවධානය යොමු විය. මෙම වැඩසටහනට සම්මානලාභී ෆැක්ටම් පදනමේ **ඉම්රාන් ඛාන්** සහ, ලෝක ස්මාරක අරමුදලේ **ජෝන් ඩාර්ලින්ටන්** සහ **හවියෙර් ඔර්ස් ඔසින්** විසින් මෙහෙයවූ වැඩමුළු දෙකක් ඇතුළත් වුණු අතර, 'ගෘහ නිර්මාණ උරුම ලේඛනගතකරණයට හැඳින්වීමක්: ඡායාරේඛනමිතිය' නම් වැඩමුළුව ද, 'නවීන ගොඩනැගිලි ලේඛනගත කිරීම' පිළිබඳ වැඩමුළුවක් ද එහිදී පැවැත්විණි.

**බ්‍රිතාන්‍ය කවුන්සිලයේ** සහාය ඇතිව **ලෝක ස්මාරක අරමුදල** සමඟ හවුලේ නිර්මාණය වූ කෞතුකාගාර තීව්‍ර වැඩසටහනේ මෙම සංස්කරණය, නවීන ගෘහ නිර්මාණ ශිල්පය හා සම්බන්ධ කෞතුකාගාර පුහුණුව සැමට ප්‍රවේශ විය හැකි, වඩාත් සහයෝගී, හා ගෝලීය වශයෙන් අදාළ වන යමක් බවට පත් කිරීමට MMCA ශ්‍රී ලංකාහි කැපවීම ඉස්මතු කළේ ය.

## පර්යේෂණ ප්‍රවර්ධනය

අපගේ වර්තමාන පර්යේෂණවල මූලික පදනමක් වන්නේ කලාකෘති හා ආකයිව සූචිකරණය සහ ඩිජිටල්කරණය කිරීමයි. මෙය සාක්ෂාත් කරගැනීම සඳහා, පර්යේෂණ සහායක **ධිලාෂිනි කාර්තිගේසු** සහ පුහුණු ලේඛනාරක්ෂක **යසස්වි මුණසිංහ** සහ **ඒරන් සෙනෙවිරත්න**, පර්යේෂණ සහ ලේඛනගාර භාවිතයන් පිළිබඳව පුහුණුව ලබා ඇත. ඔවුන් තිදෙනා ම MMCA ශ්‍රී ලංකාහි බාහිර අධ්‍යාපනඥයින් ලෙස සිය ගමන ආරම්භ කළ අය බව පැවසීම අපට විශාල සතුටක් වන අතර, මින් පිළිබිඹු වන්නේ අනාගත පරපුරේ වෘත්තිකයින් පෝෂණය කිරීමට කෞතුකාගාරයේ නොමද කැපවීමයි.

## ජයග්‍රහණ සැමරීම

**අනෝමා රාජකරුණා** (උ.1965) විසින් නිර්මාණය කරන ලද **'No More Land'** (2024) වාර්තා චිත්‍රපටිය, ඉන්දියාවේ කොල්කටාහි පැවති 8වන දකුණු ආසියානු කෙටි චිත්‍රපට උළෙලේදී සත්‍යජිත් රේ ලෝකඩ සම්මානය (වාර්තා චිත්‍රපට) ලබාගත් බව අප සතුටින් දැනුම් දෙමු. මෙම චිත්‍රපටය MMCA ශ්‍රී ලංකා විසින් නිර්මාණ කිරීමට පවරන ලද අතර යුරෝපා සංගමයේ අරමුදලින්, බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් ක්‍රියාත්මක කරන ලද ඵලදායිව ආරවුල් නිරාකරණයට සහයවීම (SEDR) ව්‍යාපෘතියේ අරමුදලින් නිර්මාණය වූවකි.

ඒ හැරුණුකොට, MMCA ශ්‍රී ලංකා විසින් අපගේ අක්කර 88 ප්‍රදර්ශනය සඳහා නිර්මාණය කිරීමට පැවරූ **ඉරුෂි තෙන්නකෝන්** (උ.1989), **සුමේධ කැලෑගම** (උ.1988), සහ **සුමුදු**

**අතුකෝරල** (උ.1980) නිර්මාණය කළ, **'is this an architectural documentary?' (2023)** සජීවිකරණ වාර්තා චිත්‍රපටය, ඔක්තෝම්බර් 5 පැවැත්වුණු වෙක් ජනරජයේ 14වන චිත්‍රපට සහ ගෘහ නිර්මාණ උළෙලේ දී එරටදී ප්‍රථම වරට තිරගත විය.

**ආදි කර්තෘ අනුග්‍රාහක කලා සංචාරය**

සැප්තැම්බර් 20–21 දෙදින MMCA ශ්‍රී ලංකාහි ආදි කර්තෘ අනුග්‍රාහකයින් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ, අභිරක්ෂිත කලා සංචාරයකට සහභාගී විය. කලාකරුවන් කිහිප දෙනෙකුගේ ශිල්පාගාර නැරඹීමට අමතරව, ගෘහ නිර්මාණ ශිල්පී **ෆිලිප් වීරරත්න** විසින් මෙහෙයවූ, ටදාඕ ඇන්ඩෝ සහ ෂිගෙරු බාන් විසින් නිර්මාණය කරන ලද නිවාසවල මග පෙන්වූ සංචාර සහ, ගෘහ නිර්මාණ ශිල්පී **සුමේධ කැලෑගම** විසින් මෙහෙයවන ලද ජෙෆ්රි බාවාගේ (1919–2003) රෙඩ් ක්ලිෆ් මිරිස්ස වෙත සංචාරයක් ද මෙම කණ්ඩායම අත්වින්දෝ ය.

**ඉදිරිය දෙස බැලීම**

MMCA ශ්‍රී ලංකා තමාගේ ම ස්ථිර නිවහනක් පිහිටුවීමට යන ගමනේදී, අපගේ සෑම කටයුත්තක ම ප්‍රමුඛතාව ගන්නේ ශ්‍රී ලංකාවේ පළමු නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය නිර්මාණය කිරීමේ අපගේ මෙහෙවරයි.

ඉදිරියේදී පැමිණීමට නියමිතව ඇති, 2026 ජනවාරි මාසයේ පැවැත්වෙන අපගේ පළමු කෙටි කාලීන ප්‍රදර්ශනය හරහා ද අපි සියල්ලන්ට නොමිලේ ප්‍රවේශ විය හැකි, අධ්‍යාපනය ලබාදෙන, සහ සංවාද ඇතිකරන කෞතුකාගාරයක් නිර්මාණය කිරීමට අපගේ කැපවීම නොනවත්වා ඉදිරියට ගෙන යයි.